(නවවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක **19**.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2023 අප්‍රේල් 27 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **අජිත් රාජපක්ෂ මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා

ගරු **ටිරාන් අලස් මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා

ගරු **නසීර් අහමඩ් මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **ජීවන් තොන්ඩමන් මහතා,** ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **මනුෂ නානායක්කාර මහතා,** කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමා

ගරු **නලින් ප්‍රනාන්දු මහතා,** වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා

ගරු **නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **කෙහෙලිය රඹුක්වැල්ල මහතා,** සෞඛ්‍ය අමාත්‍යතුමා

ගරු **ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා

ගරු **විදුර වික්‍රමනායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා

ගරු **ජනාධිපති නීතිඥ එම්. යූ. එම්. අලි සබ්රි මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **දිලුම් අමුණුගම මහතා,** ආයෝජන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා
ගරු **(වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය,** සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා
ගරු **ලසන්ත අලගියවන්න මහතා,** ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යතුමා
ගරු **ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා
ගරු **අ. අරවින්ද් කුමාර් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා
ගරු **ඩයනා ගමගේ මහත්මිය,** සංචාරක රාජ්‍ය අමාත්‍යතුමා
ගරු **සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා,** ග්‍රාමීය මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා
ගරු **ඩී. වී. චානක මහතා,** විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා
ගරු **නීතිඥ සිසිර ජයකොඩි මහතා,** දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යතුමා
ගරු **අනුරාධ ජයරත්න මහතා,** අධිකරණ හා බන්ධනාගාර කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා
ගරු **චාමර සම්පත් දසනායක මහතා,** ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා
ගරු **පියල් නිශාන්ත ද සිල්වා මහතා,** ධීවර රාජ්‍ය අමාත්‍යතුමා
ගරු **නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා
ගරු **සනත් නිශාන්ත මහතා,** ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා
ගරු **අනුප පස්කුවල් මහතා,** සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමා
ගරු **අශෝක ප්‍රියන්ත මහතා,** ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා
ගරු **ශාන්ත බණ්ඩාර මහතා,** ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා
ගරු **තාරක බාලසූරිය මහතා,** විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා
ගරු **විජිත බේරුගොඩ මහතා,** පිරිවෙන් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා
ගරු **කේ. කාදර් මස්තාන් මහතා,** ග්‍රාමීය ආර්ථික රාජ්‍ය අමාත්‍යතුමා
ගරු **ලොහාන් රත්වත්තේ මහතා,** වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා
ගරු **ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා
ගරු **ජානක වක්කුඹුර මහතා,** පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා
ගරු **තේනුක විදානගමගේ මහතා,** නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍යතුමා
ගරු **එස්. වියාලේන්ද්‍රන් මහතා,** වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා
ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා
ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා
ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා
ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **සෙල්වම් අඩෙක්කලනාදන් මහතා**

ගරු ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා

ගරු කපිල අතුකෝරල මහතා

ගරු නීතිඥ තලතා අතුකෝරල මහත්මිය

ගරු සම්පත් අතුකෝරල මහතා

ගරු තිස්ස අත්තනායක මහතා

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා

ගරු වජිර අබේවර්ධන මහතා

ගරු අශෝක් අබේසිංහ මහතා

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය

ගරු මායාදුන්න චින්තක අමල් මහතා

ගරු තවරාජා කලෙයි අරසන් මහතා

ගරු ජේ. සී. අලවතුවල මහතා

ගරු ඩලස් අලහප්පෙරුම මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා

ගරු එම්. උදයකුමාර් මහතා

ගරු (ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා

ගරු සංජීව එදිරිමාන්න මහතා

ගරු අකිල එල්ලාවල මහතා

ගරු ලලිත් එල්ලාවල මහතා

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා

ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු නීතිඥ සාගර කාරියවසම් මහතා

ගරු ෆයිසාල් කාසිම් මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු උදයන කිරිඳිගොඩ මහතා

ගරු ලලිත් වර්ණ කුමාර මහතා

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු උදය ගම්මන්පිල මහතා

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු උදයකාන්ත ගුණතිලක මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා

ගරු පලනි දිගම්බරම් මහතා

ගරු දුමින්ද දිසානායක මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු සාරතී දුෂ්මන්ත මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු නීතිඥ අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු චමල් රාජපක්ෂ මහතා

ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු එම්. රාමේෂ්වරන් මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු වරුණ ලියනගේ මහතා

**ගරු  ගාමිණී ලොකුගේ මහතා**

**ගරු  ඉරාන් වික්‍රමරත්න මහතා**

**ගරු  රාජිකා වික්‍රමසිංහ මහත්මිය**

**ගරු  සී. වී. විග්නේෂ්වරන් මහතා**

**ගරු  රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**

**ගරු  චමින්ද විජේසිරි මහතා**

**ගරු  නීතිඥ මධුර විතානගේ මහතා**

**ගරු  නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා**

**ගරු  විමල් වීරවංශ මහතා**

**ගරු  ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා**

**ගරු  ඩී. වීරසිංහ මහතා**

**ගරු  වීරසුමන වීරසිංහ මහතා**

**ගරු  (ආචාර්ය) සරත් වීරසේකර මහතා**

**ගරු  සිවඥානම් ශ්‍රීතරන් මහතා**

**ගරු  ජගත් සමරවික්‍රම මහතා**

**ගරු  ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**

**ගරු  ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**

**ගරු  වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු  නීතිඥ ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා**

**ගරු  (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**

**ගරු  නීතිඥ රවුෆ් හකීම් මහතා**

**ගරු  එච්. එම්. එම්. හරීස් මහතා**

**ගරු  (මහාචාර්ය) චරිත හේරත් මහතා**

**ගරු  සමන්ප්‍රිය හේරත් මහතා**

**ගරු  මර්ජාන් ෆලීල් මහතා**

**ගරු  ඒ. එච්. එම්. ෆවුසි මහතා**

**ගරු  ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

ටිකිරි කේ.ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1.ලිපි ලේඛනාදිය පිළිගැන්වීම:** (1) නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යවරයා විසින් 2021 වර්ෂය සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යවරයා විසින් 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 43 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 දෙසැම්බර් 22 දිනැති අංක 2311/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග පිළිගන්වා එම නියෝග රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් —

(i) 2021 වර්ෂය සඳහා මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ දාහත්වන වාර්ෂික වාර්තාව; සහ

(ii) 2021 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛවතාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව

ඉදිරිපත් කර එම වාර්තා, අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින්—

(i) 2020 වර්ෂය සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

ඉදිරිපත් කර එම වාර්තා බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යවරයා විසින්—

(i) 2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අරමුදලේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව

ඉදිරිපත් කර එම වාර්තා ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යවරයා විසින්—

(i) 2015, 2016, 2017, 2018, 2019 සහ 2020 වර්ෂ සඳහා සීමාසහිත පරන්තන් කෙමිකල්ස් සමාගමේ වාර්ෂික වාර්තා; සහ

(ii) 2021 වර්ෂය සඳහා තුරුසවිය අරමුදලේ වාර්ෂික වාර්තාව

ඉදිරිපත් කර එම වාර්තා ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යවරයා විසින් 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව ආහාර සුරක්ෂිතතාව හා කෘෂිකර්මය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව මාධ්‍ය, තාරුණ්‍ය, උරුමය හා නූතන පුරවැසියා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**2. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) මිහින්තලේ, නුවර පාර, කටුකැලියාව හන්දිය යන ලිපිනයෙහි පදිංචි ඩබ්. හේමරත්න මහතාගෙන් ලැබුණු 2023.02.12 දිනැති පෙත්සම ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා විසින් පිළිගන්වන ලදී.

(2) මාතර, මැද්දවත්ත, බඳුවත්ත යන ලිපිනයෙහි පදිංචි එම්.ඩබ්. උපුල් කුමාර මහතාගෙන් ලැබුණු 2023.02.14 දිනැති පෙත්සම ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරනු ලැබේ.

**3.දූෂණ විරෝධී:** අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා පිළිගැන් වූ පනත් කෙටුම්පත,— දූෂණයට එරෙහි සහ වෙනත් ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සම්මතයන්, ප්‍රමිති සහ ප්‍රශස්ත පරිචයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියේ නිශ්චිත විධිවිධාන බලාත්මක කිරීම සඳහා ද; වත්කම් සහ බැරකම් ප්‍රකාශවලට අදාළ අල්ලස්, දූෂණ සහ වැරදි පිළිබඳ චෝදනා සහ ආශ්‍රිත වැරදි අනාවරණය සහ විමර්ශනය කිරීමට, සහ වත්කම් සහ බැරකම් ප්‍රකාශවලට අදාළ අල්ලස්, දූෂණ වැරදි සහ ආශ්‍රිත වැරදි සඳහා නඩු පැවරීමට විධාන කිරීමට සහ නඩු

පැවරීමට ස්වාධීන කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; දූෂණ ක්‍රියා වැළැක්වීම ප්‍රවර්ධනය ඉහළ නැංවීම සඳහා ද; දූෂණයට එරෙහිව සටන් කිරීම සඳහා මහජනතාව දැනුවත් කිරීම සහ මහජනතාව අතර දැනුවත් බව ඉහළ නැංවීම සඳහා ද; (26 වන අධිකාරය වූ) අල්ලස් පනත, 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීමේ පනත පරිච්ඡින්න කිරීමට සහ ඒ හා සම්බන්ධ හෝ එයට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත මුද්‍රණය කළ යුතු යැයි ද 2023 මැයි 11 බ්‍රහස්පතින්දා දෙවැනිවර කියවිය යුතු යැයි ද යුක්තිගරුක සහ නීතිගරුක සමාජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**4. වරප්‍රසාද:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අජිත් රාජපක්ෂ මහතා විසින් තමන්ගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2023 ජනවාරි 17 දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118 හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**5.පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය:** ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා, ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ආචාර්ය පූජ්‍ය හාරිස්පත්තුවේ අරියවංශාලංකාර මාහිමි පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත පළමුවර කියවා මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52(6) අනුව පනත් කෙටුම්පත බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා වෙත යොමු කරන ලදී.

**6.ශ්‍රී ලංකාව සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) විස්තීරණ අරමුදල් පහසුකම (EFF) යටතේ වූ සැකසුම ක්‍රියාත්මක කිරීම සඳහා වූ යෝජනා සම්මතය:** විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2023 අප්‍රේල් 26),— "අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 23/0727/604/058-1 සඳහා වූ 2023 අප්‍රේල් 17 දිනැති අමාත්‍ය මණ්ඩලයේ තීරණයට අනුව, ශ්‍රී ලංකාවේ ආර්ථිකය කඩිනම් ප්‍රගතියක් ලබා ගැනීම සඳහා සහ වර්තමාන සහ අනාගත පරම්පරාවට ප්‍රයෝජනවත් වන තිරසර ආර්ථික වර්ධනයක් සඳහා, ශ්‍රී ලංකා

රජය සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අතර එළැඹි SDR බිලියන 2.286 ක (ඇ.එ.ජ.ඩො. බිලියන 3.0 ක් පමණ) මාස 48 ක විස්තීරණ අරමුදල් පහසුකමේ සැකසුම, 2023 මාර්තු 22 දින සභාගත කරන ලද අතර, එම සැකසුම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සියලුම අනුමතිය, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයට ලබාදිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි.''යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

''ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය මූලාසනාරූඪ විය යුතු ය''යි සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(පූ.භා. 10.57 ට ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය මූලාසනාරූඪ වූවා ය.)

''ගරු නීතිඥ එස්. එම්. එම්. මුෂාරෆ් මහතා මූලාසනාරූඪ විය යුතු ය''යි කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 1.02 ට ගරු නීතිඥ එස්. එම්. එම්. මුෂාරෆ් මහතා මූලාසනාරූඪ විය.)

''ගරු හර්ෂණ රාජකරුණා මහතා මූලාසනාරූඪ විය යුතු ය''යි පරිසර අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.06ට ගරු හර්ෂණ රාජකරුණා මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 2.43 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

''ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය යුතු ය''යි සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 5.41 ට ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය.)

එකල්හි වේලාව අ.භා. 5.00 පසු වූයෙන් විවාදය කල් තබන ලදී. එතැන් සිට විවාදය 2023 අප්‍රේල් 28 සිකුරාදා පවත්වනු ලැබේ.

**7.කල් තැබීම (වැන්දඹු දෙමව්පියන්ගේ දරුවන් වෙනුවෙන් මනෝ සමාජයීය ආරක්ෂණ වැඩ පිළිවෙළක්)** : ''මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය''යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

එකල්හි වේලාව අ.භා. 5.30 පසුකර තිබුයෙන් අ. භා. 6.43 ට මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් අද දින සභා සම්මතිය අනුව ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2023 අප්‍රේල් 04 දින සභා සම්මතිය අනුව 2023 අප්‍රේල් 28 සිකුරාදා පූ.භා. 9.30 වනතෙක් කල් ගියේය.